*3.1.3 ~~සංවිධාන~~ආයතනවල සේවා අත්පොත් අඛණ්ඩව සමාලෝචනය කළ යුතු වන අතර ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතු හේතුවෙන් ප්‍රතිඵලය වන වෙනස් කිරීම්/වැඩිදියුණු කිරීම් යොදා යාවත්කාල කළ යුතුය.*

## 3.2 සංවිධානාන්තර ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතු

***ප්‍රතිපත්ති ප්‍රකාශය - සම්බන්ධිත සහ සුමට ආකාරයකින් පුරවැසියා කේන්ද්‍රගත කරගත් සේවා සැපයීම පිණිස, එක් විශේෂිත සේවා ගොන්නක් තුළ සේවා සපයන සියලුම රාජ්‍ය ~~සංවිධාන~~ආයතන පහත සඳහන් සහයෝගිතා අත්කර ගත යුතුය;***

- ***ක්‍රියාකාරිත්ව වාග් කෝෂය සම්පූර්ණ කිරීම***
- ***ක්‍රියාවලි සිතියම සහ ක්‍රියාවලි ශබ්දකෝෂය සම්පූර්ණ කිරීම***
- ***ක්‍රියාවලි ද්විත්ව පිටපත් ඇතිවීම හඳුනාගැනීම සහ රාජ්‍ය ~~සංවිධාන~~ආයතනවල භූමිකා තාර්කීකරණය කිරීම***
- ***අන්තර් සංවිධාන ක්‍රියාවලි ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතුවලට බඳුන් කිරීම***
- ***සේවා සමූහය සඳහා අවශ්‍ය LIFe ප්‍රමිති නිර්වචනය කිරීම***
- ***ගොන්න මට්ටමේ ඩිජිටල් රාජ්‍ය විසඳුම් ක්‍රියාවේ යෙදවීම***

*3.2.1 සහයෝගිතා ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සපයනු පිණිස ගොන්නට අයත් ~~සංවිධාන~~ආයතන විසින් රාජ්‍ය ප්‍රධාන නවෝත්පාදන නිලධාරී කාර්යාලයේ සාමාජික ~~සංවිධාන~~ආයතන අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය. මේ සඳහා වන අච්චු ආකෘතියක් 13 වන ඇමුණුම -- අවබෝධාත්මක ගිවිසුමක් සඳහා අච්චු ආකෘතිය වෙතින් අත්කර ගැනීමට පුළුවන.*

*3.2.2 එකම ව්‍යාපාරික වසමක අන්තර් සංවිධානමය ක්‍රියාවලියක් හා සම්බන්ධ විය යුතු සලකා බැලෙන පුරවැසි සේවා ක්ෂේත්‍රයක් හෝ ක්‍රියාවලි ප්‍රශස්තකරණ ක්ෂේත්‍රයක් (3.1.2 පරිදි) හඳුනාගනු ලැබූ කාරණයක දී, එවැනි බාධක ජයගනු පිණිස අන්තර් සංවිධානමය රාජ්‍ය ක්‍රියාවලි ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතුවලට බඳුන් කිරීමේ ක්‍රියාවලියක් කරගෙන යා යුතුය. රාජ්‍ය ක්‍රියාවලි ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතුවලට බඳුන් කිරීම සඳහා මෙහෙයුම් නිර්ණායකයක් 12 වන ඇමුණුම - රාජ්‍ය ක්‍රියාවලි ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතුවලට බඳුන් කිරීම සඳහා මෙහෙයුම් නිර්ණායක වෙතින් අත්කර ගනු ලැබිය යුතුය.*

*3.2.3 සම්බන්ධිත සේවා සැපයීම සඳහා සේවා සපයන ගොන්නක වැඩ කරන සියලුම රාජ්‍ය ~~සංවිධාන~~ආයතන වාර්ෂික පදනමකින් ඉ-ඒකාබද්ධතා අනුකූලතා විගණනයක් කරගෙන යා යුතුය. 14 වන ඇමුණුම - ඉ-ඒකාබද්ධතා විගණනය සඳහා මෙහෙයුම් නිර්ණායක තුළ සපයා ඇති මෙහෙයුම් නිර්ණායක අනුකූලතා විගණනය කරගෙන යාම පිණිස භාවිත කළ හැකිය.*

**4 වන කොටස - 4 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති**

**යහපත් රාජ්‍ය පාලනයක ඉලක්ක - ඵලදායී, කාර්යක්ෂම**

***4 වන පරමාර්ථය - රාජ්‍ය ~~සංවිධාන~~ආයතන ඇතුළත සහ ඔස්සේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම්, තොරතුරු රැස් කිරීම, රාජ්‍ය ක්‍රියාවලි සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම් ආදියෙහි ද්විත්ව පිටපත් ජනනය මගහැරීම පිණිස ඩිජිටල් රජය භාවිත කිරීම.***

***කොටසේ උප මාතෘකා***

**4.1 ලද හැකි පුනර්භාවිත ඩිජිටල් රාජ්‍ය විසඳුම් දත්ත පොත**

**4.2 ලද හැකි විසඳුම්වල ගැළපීම**

**4.3 පොදු යෙදවීම්**

**4.4 පොදු යටිතල පහසුකම් භාවිත කිරීම**

**4.5 දත්ත නැවත භාවිත කිරීම**

## 4.1 ලද හැකි පුනර්භාවිත ඩිජිටල් රාජ්‍ය විසඳුම් දත්ත පොත

***ප්‍රතිපත්ති ප්‍රකාශය - ලද හැකි පුනර්භාවිත ඩිජිටල් රාජ්‍ය විසඳුම් දත්ත පොතක් නඩත්තු කිරීම පිණිස, සියලුම රාජ්‍ය ~~සංවිධාන~~ආයතන සිය රජයට අදාළ පුනර්භාවිත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම්වල විස්තර සැපයිය යුතුවේ***

*4.1.1 තොරතුරු සහ සන්නිවේදන විසඳුම් අඩංගු දත්ත පොතක් නඩත්තු කිරීම සඳහා ලද හැකි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම් පිළිබඳ තොරතුරු සියලුම රාජ්‍ය ~~සංවිධාන~~ආයතන මගින් සැපයිය යුතුය. ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් රාජ්‍ය විසඳුම් දත්ත පොතක් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් නඩත්තු කරනු ඇත.*

*4.1.2 අළුත් විසඳුමක් සංවර්ධනය කරන හැමවිටකම, හිමිකාර රාජ්‍ය ~~සංවිධාන~~ආයතනය මගින් හැකි උපරිම තරමට පුනර්භාවිත සංරචකවලින් සමන්විත වන බව තහවුරු කළ යුතුය, පුනර්භාවිත විසඳුම්වල දත්ත පොතක් https://egovsolutions.lgcc.gov.lk හිදී සොයාගත හැකිය.*

## 4.2 ලද හැකි විසඳුම්වල ගැළපීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - අළුත් විසඳුමක් සංවර්ධනය කිරීමට පෙරාතුව, සෑම රාජ්‍ය ~~සංවිධාන~~ආයතනයක් විසින්ම ද්විත්ව පිටපත් ඇතිවීම වළක්වාලීම සඳහා අනෙකුත් රාජ්‍ය ~~සංවිධාන~~ආයතන සතුව දැනටමත් එවැන්නක් පවතින්නේදැයි යන්න සහ දැනටමත් පවතින තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම්වල ලද හැකියාව සහ ගැළපීම සත්‍යාපනය කරගත යුතුය***

*4.2.1 කිසියම් ඩිජිටල් රාජ්‍ය පද්ධතියක් සංවර්ධනය කිරීමට පෙරාතුව, රාජ්‍ය ~~සංවිධාන~~ආයතන විසින් එවැනි විසඳුම් භාවිත කරන පුනර්භාවිත විසඳුම් ලද හැකිව පවතින බව සහ එවැනි විසඳුම් භාවිත කිරීමේ හැකියාව සත්‍යාපනය කරගත යුතුය.*

*4.2.2 රාජ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම් නැවත භාවිත කිරීමට ඉඩ දෙනු පිණිස, රාජ්‍ය ~~සංවිධාන~~ආයතන විසින් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ හිමිකාරිත්ව පද්ධති සහ කලින් සාකච්ඡා කර ගැනීමෙන් අනතුරුව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ හිමිකාරිත්වය පවත්වා ගත යුතුය.*

## 4.3 පොදු යෙදවීම්

***ප්‍රතිපත්ති ප්‍රකාශය– සියලුම රාජ්‍ය ~~සංවිධාන~~ ක විසින් ප්‍රයත්න ද්විත්වතා අඩුකර ගැනීම සඳහා සහ එනයින් රජයේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා පොදු හවුලේ පරිහරණය කරන යෙදවීම් භාවිත කළ යුතුය***

*4.3.1 ඒකාබද්ධ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය, මූල්‍ය කළමනාකරණ පද්ධතිය, භාණ්ඩ සහ වත්කම් කළමනාකරණ පද්ධතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මුදල් අමාත්‍යාංශය වැනි හිමිකරුවන් විසින් සංවර්ධනය කළ යුතුය.*

*4.3.2 සියලුම රාජ්‍ය සංවිධාන විසින් සංවිධානවල අවශ්‍යතා සපුරාගැනීම සඳහා මධ්‍යගත පද්ධතිය භාවිත කළ යුතුය.*

*4.3.3 සේවා සැපයුම් සමූහයකට අයත් කිසියම් සංවිධානයක් අදාළ අවස්ථා හැමකකදීම පොදු සමූහ යෙදවුම් භාවිත කළ යුතුය.*

## 4.4 පොදු යටිතල පහසුකම් භාවිත කිරීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - සියලුම රාජ්‍ය සංවිධාන පොදු තොරතුරු සහ සන්නිවේදන යටිතල පහසුකම් භාවිත කළ යුතුය. (A) LGN, (B) LG, (C) LGC (D) Country Portal (E) Mobile Portal (F) GovSMS (G) LGPS (H) GIC සහ සිය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සපුරා ගැනීම පිණිස රජය මගින් සංවර්ධනය කළ අනෙකුත් යටිතල පහසුකම් සහ පුරවැසි සේවා සැපයීම භාවිත කළ යුතුය***

*4.4.1* සියලුම රාජ්‍ය සංවිධාන දත්ත සහ තොරතුරු රාජ්‍ය සංවිධාන සමඟ බෙදාහදා ගැනීම සඳහා ලංකා රාජ්‍ය ජාලය *LGN භාවිත කළ යුතු වේ. (15 වන ඇමුණුම – ලංකා රාජ්‍ය ජාලය හා සම්බන්ධිත රාජ්‍ය සංවිධාන නම් ලැයිස්තුව)*

*4.4.2 සියලුම රාජ්‍ය සංවිධාන විසින් පුරවැසි සේවා සැපයීම සඳහා ලංකා ගේට් අතරමැදි මෘදුකාංග යටිතල පහසුකම්, දේශ ද්වාරය සහ ජංගම ද්වාරය භාවිත කළ යුතුය.*

*4.4.3 සියලුම රාජ්‍ය සංවිධාන විසින් තම තොරතුරු යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරා ගැනීමට සහ ඉලෙක්ට්‍රොනික් සේවාවල කාර්යක්ෂමතාව සහ ඵලදායකත්වය වැඩිදියුණු කිරීම සඳහා වළාකුළු පදනම් කරගත් මෘදුකාංග සේවා පරිභෝජනය කිරීමට ලංකා රාජ්‍ය වළාකුළ භාවිත කළ යුතුය. LGC පිහිටුවා ඇත්තේ LGN මධ්‍යයේ බැවින්, සහ සම්බන්ධිත රාජ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය අන්තර් සම්බන්ධතා, රාජ්‍ය සංවිධාන වැඩි හරියක් ලංකා රාජ්‍ය ජාලයට සම්බන්ධිත බැවින්, ඒ හරහා ඵලදායීව සැපයිය හැකිය. (16 වන ඇමුණුම – LGC සේවා ලේඛනය පරිශීලනය කරන්න)*

*4.4.4 සියලුම රාජ්‍ය සංවිධාන පුරවැසි සේවා සැපයීමේ දී, ඉලෙක්ට්‍රොනික් ගෙවීම් සැකසුම් කිරීමට ලංකා රාජ්‍ය ගෙවීම් සේවාව (LGPS) භාවිත කළ යුතුය. (17 වන ඇමුණුම – LGPS සේවා ලේඛනය පරිශීලනය කරන්න)*

*4.4.5 ජංගම දුරකථන හරහා පුරවැසි සේවා සපයන සියලුම රාජ්‍ය සංවිධාන GovSMS භාවිත කළ යුතුය. (18 වන ඇමුණුම – GovSMS සේවා ලේඛනය පරිශීලනය කරන්න)*

*4.4.6 සියලුම රාජ්‍ය සංවිධාන විසින් මහජනතාවට සේවා සම්බන්ධ තොරතුරු සපයන පුරවැසි සේවා සඳහා රාජ්‍ය ඇමතුම් කේන්ද්‍රය වන GIC භාවිත කළ යුතුය. එසේ කිරීම සඳහා තොරතුරු අච්චු ආකෘති භාවිත කිරීම මගින් සේවා සම්බන්ධ තොරතුරු සැපයිය යුතු වන අතර අවම වශයෙන් අවුරුද්දකට දෙවතාවක්වත් එවැනි තොරතුරු යාවත්කාල කළ යුතුය. සේවා සැපයුම් ක්‍රියාවලිය, සංවිධානය, සබඳතා තොරතුරු, සංවිධාන ව්‍යුහය වෙත කරන කිසියම් වෙනස් කිරීමක් සේවා තොරතුරු අත්පොත් යාවත්කාල කිරීම මගින් වහාම සැපයිය යුතුය.*
*(19 වන ඇමුණුම – GIC අත්පොත සඳහා අච්චු ආකෘතිය)*

*4.4.7 ඉලෙක්ට්‍රොනික් සේවා සපයන රාජ්‍ය සංවිධාන උපකාර කවුළු සහය සැපයීම සඳහා GIC - 1919 භාවිත කළ යුතුය. එවැනි සේවා සඳහා GIC භාවිත කිරීම පිණිස අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා සූදානම් කළ අත්පොත භාවිත කළ යුතුය. (19 වන ඇමුණුම – GIC අත්පොත සඳහා අච්චු ආකෘතිය)*

## 4.5 දත්ත නැවත භාවිත කිරීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - රාජ්‍ය සංවිධාන හැකිතාක් දුරට සංවිධානය ඇතුළත හෝ විශේෂිත සේවා වසමක් තුළ දැනටමත් රැස් කර තිබෙන තොරතුරු නැවත භාවිත කළ යුතුය. ePopulation ලියාපදිංචි කරන ලේඛනය, ඉඩම් ලියාපදිංචි කරන ලේඛනය, සමාගම් ලියාපදිංචි කරන ලේඛනය ආදී ප්‍රධාන දත්ත මධ්‍යස්ථාන තුළ ලද හැකි දත්ත නැවත භාවිත කිරීම සඳහා විශේෂ අවධානයක් ගත යුතුය.***

*4.5.1 සංවිධානාභ්‍යන්තර සහ සංවිධානාන්තර ක්‍රියාවලි සඳහා තොරතුරු සපයනු පිණිස හැකියාව සලසනු සඳහා සංවිධානමය තොරතුරු/අන්තර්ගතය සැලසුම් කළ යුතුය.*

*4.5.2 සියලුම රාජ්‍ය සංවිධාන GIC මගින් නඩත්තු කරන තොරතුරුවල ලද හැකියාව සත්‍යාපනය කිරීම සඳහා රාජ්‍ය පොදු ඉලෙක්ට්‍රොනික් තොරතුරු දත්ත පොත පරිශීලනය කළ යුතුය.*

*4.5.3 ජනගහණය, ඉඩම් සහ වාණිජ සංස්ථාපිත හා සම්බන්ධ මූලික දත්ත අදාළ හිමිකරුවන්ගේ දත්ත මධ්‍යස්ථාන වෙතින් අත්කර ගත යුතුය. එක් එක් මධ්‍යස්ථානයේ දත්ත හිමිකරුවන් මෙසේ විය යුතුය: ඉඩම් ලියාපදිංචි කිරීමේ දත්ත මධ්‍යස්ථානය සහ ජනගහණ ලියාපදිංචි කිරීමේ මධ්‍යස්ථානයේ දත්ත හිමිකරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විය යුතුය; සමාගම් ලියාපදිංචි කිරීමේ දත්ත හිමිකරු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විය යුතුය. එක් එක් දත්ත මධ්‍යස්ථාන හිමිකරුවන් නිරවද්‍යතාව, දත්ත රහස්‍යතාව සහ ඒකාබද්ධතාව, ප්‍රවේශ රීති, නියාමන සහ දත්ත යාවත්කාල සඳහා වගකිව යුතුය.*

*4.5.4 අවශ්‍ය කරන තොරතුරු ලද හැකිව තිබේනම්, එවැනි තොරතුරු අත්කර ගැනීම සඳහා මධ්‍යස්ථාන දත්ත හිමිකරු සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය. එවැනි තොරතුරු භාවිත කරනු ලැබිය හැකි අරමුණු මධ්‍යස්ථානයේ හිමිකාර සංවිධානයේ තොරතුරු වර්ගීකරණය මගින් නිර්වචනය කෙරෙනු ඇත.*

*4.5.5 මධ්‍යස්ථානයේ එක් එක් දත්ත වාර්තාවේ අනන්‍යතාව තහවුරු කිරීම පිණිස, ශ්‍රී ලංකා අනන්‍යතා අංකය (SLIN), සමාගම් ලියාපදිංචි කරන අංකය, සහ ඉඩම් හඳුනාගැනීමේ අංකය ආදිය වැනි අනන්‍ය හැඳුනුම් භාවිත කෙරේ. මධ්‍යස්ථාන වෙතින් දත්ත අත්කර ගැනීමට අදහස් කරන සංවිධාන, මෙසේ හෙයින්, දත්ත අන්තර් මෙහෙයුම් හැකියාව තහවුරු කර ගැනීම සඳහා තම පද්ධති තුළ එම අනන්‍ය හැඳුනුම්වල දත්ත ප්‍රමිති භාවිත කළ යුතුය.*

## 5 වන කොටස - 5 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

## යහපත් රාජ්‍ය පාලන ඉලක්කය - ගිණුම් කටයුතු භාවය

## 5 වන පරමාර්ථය - සියලුම රාජ්‍ය සේවා සඳහා නිර්වචනය කළ සේවා මට්ටම් අත්කර ගැනීම, මිනුම් ගැනීම, අධීක්ෂණය සහ ප්‍රකාශනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිත කිරීම

*<u>කොටසේ උප මාර්තෘකා</u>*

**5.1 සංවිධානමය සේවා මට්ටම් අත්කර ගැනීම සඳහා ඩිජිටල්**

### 5.1 සංවිධානමය සේවා මට්ටම් අත්කර ගැනීම සඳහා ඩිජිටල් රාජ්‍ය භාවිත කිරීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - සියලුම රාජ්‍ය සංවිධාන සියලුම රාජ්‍ය සේවා සඳහා නිර්වචනය කළ සේවා මට්ටම් අත්කර ගැනීම, මිනුම් ගැනීම, අධීක්ෂණය සහ ප්‍රකාශනය කිරීමට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යොදවා ගත යුතුය***

*5.1.1 සියලුම රාජ්‍ය සංවිධාන අභ්‍යන්තර සංවිධානමය ක්‍රියාවලි සහ තම ඉලක්කගත සේවා ලබා දීමේ මට්ටම (පුරවැසි ප්‍රඥප්තියේ සේවා මට්ටම් බලන්න) අත්කර ගැනී සඳහා අවශ්‍ය කාලීන විස්තර කරමින් සංවිධානමය සේවා ලබා දීමේ ප්‍රමිති විශේෂණය කොට දැක්විය යුතුය. සම්බන්ධිත සේවා සපයන සංවිධාන සඳහා අච්චු ආකෘතිය 20 වන ඇමුණුම - සමූහ විශේෂිත පුරවැසි ප්‍රඥප්තිය මගින් දී ඇති අතර සමූහ විශේෂිත පුරවැසි ප්‍රඥප්තියේ සේවා මට්ටම් හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකිය.*

*5.1.2 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම එක් එක් සේවාව සඳහා සේවා ප්‍රමිති ප්‍රසිද්ධ කළ යුතු වන අතර එක් එක් සේවාවේ සත්‍යතා මට්ටම් වාර්තාගත කළ යුතුය.*

*5.1.3 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම සේවාවේ ගුණාත්මක භාවය තක්සේරු කළ යුතු අතර වාරානුකූලව එම වාර්තා ප්‍රසිද්ධ කළ යුතුය, එනයින් සේවා ප්‍රමිති නඩත්තු කරන්නේදැයි ජනතාවට තක්සේරුවක් ගත හැකිවනු පිණිස සබල කළ යුතුය.*

*5.1.4 රාජ්‍ය සංවිධාන මගින් ඩිජිටල් රාජ්‍ය විසඳුම් ගිවිසුම් (SLA) තුළ සේවා මට්ටම් ගිවිසුම් සංස්ථාපනය කිරීම තහවුරු කළ යුතුය. (05 වන ඇමුණුම – ඩිජිටල් රාජ්‍ය විසඳුම් සඳහා අච්චු ආකෘතිය පරිශීලනය කරන්න)*

*5.1.5 සංවිධානයෙහි ප්‍රධානියා කාලීන ප්‍රතිචාරාත්මක භාවය සහ අදහස් කරන ඉ-සේවා මට්ටම්වල අන්තර් ක්‍රියාකාරිත්වය වාරානුකූලව සමාලෝචනය කිරීම සඳහා ව්‍යාපෘති හැසිරවීමේ කමිටුවක් පත් කළ යුතුය.*

*5.1.6 රාජ්‍ය සංවිධාන විසින් පුරවැසියන්ට පිරිනමන විද්‍යුත් මාර්ගගත සේවා සඳහා පළමු මට්ටමේ උපකාර සේවය ලෙස GIC-1919 භාවිත කළ යුතුය.*

## 6 කොටස - 6 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

### *යහපත් රාජ්‍ය පාලන ඉලක්ක - අන්තර්ගත භාවය*

### 6 වන පරමාර්ථය - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මාර්ගයෙන් අඩු අවධානයක් ලබන ප්‍රජාවන්ගේ අවශ්‍යතා/ඕනෑ එපාකම් ආමන්ත්‍රණය කිරීම

*__කොටසේ උප මාතෘකා__*

**6.1 අන්තර්ගත භාවය සඳහා වන ඩිජිටල් රජය**

**6.2 අඩු අවධානයක් හිමි ප්‍රජාවන්ට වඩාත් හොඳින්**

### 6.1 අන්තර්ගත භාවය සඳහා වන ඩිජිටල් රජය

***ප්‍රතිපත්ති ප්‍රකාශය - අඩුවෙන් සැලකුම් ලබන සහ අඩු අවධානයක් හිමි පුද්ගලයින්/ප්‍රජාවන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පදනම් කරගත් සේවා ලබා දීමේ යාන්ත්‍රණය තුළ ඇතුළත් බව රාජ්‍ය සංවිධානය මගින් තහවුරු කළ යුතුය***

*6.1.1 සේවා සැපයීම සඳහා වගකිව යුතු අදාළ රාජ්‍ය සංවිධාන මගින් අඩුවෙන් සැලකුම් ලබන සහ අඩු අවධානයක් හිමි ප්‍රජාවන් වෙත වඩාත්ම පහසු ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් තොරතුරු සැපයීම කළ යුතුය.*

*6.1.2 එවැනි සංවිධාන විසින් අඩුවෙන් සැලකුම් ලබන සහ අඩු අවධානයක් හිමි ප්‍රජාවන් වෙත නාලිකා ගණනාවකින් සේවා සැපයීමට විශේෂිත යන්ත්‍රණයක් ඇති කළ යුතුය. (උදා. ජංගම සේවා ඒකකය)*

### 6.2 අඩු අවධානයක් හිමි ප්‍රජාවන්ට වඩාත් හොඳින් සලකනු පිණිස ඩිජිටල් රජය

***ප්‍රතිපත්ති ප්‍රකාශය - අඩු අවධානයක් හිමි ප්‍රජාවන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට රාජ්‍ය සංවිධාන මගින් මෙවලමක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිත කළ යුතුය***

*6.2.1 රාජ්‍ය සංවිධාන මගින් අඩු අවධානයක් හිමි ප්‍රජාවන්ට වඩාත් හොඳින් සලකනු පිණිස සහ එවැනි ප්‍රජාවන්ට ප්‍රතිලාභ සලසනු පිණිස අන්තර්මධ්‍ය යන්ත්‍රණ භාවිත කළ යුතුය.*

## 7 වන කොටස - 7 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

## යහපත් රාජ්‍ය පාලන ඉලක්ක - ප්‍රතිචාරාත්මක ගුණය

### *7 වන පරමාර්ථය - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මාර්ගයෙන් රාජ්‍ය සංවිධාන තුළ ඉහළ ප්‍රතිචාරාත්මක සහ අන්තර් ක්‍රියාකාරී ගුණ සඳහා ක්‍රියාවලි සහ පද්ධති ක්‍රියාත්මක කිරීම*

***කොටසේ උප මාර්තෘකා***

**7.1 ඉලෙක්ට්‍රොනික් නාලිකා ඔස්සේ ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීම**

### 7.1 ඉලෙක්ට්‍රොනික් නාලිකා ඔස්සේ ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - සෑම රාජ්‍ය සංවිධානයක්ම ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීමට ඉලෙක්ට්‍රොනික් නාලිකා විවෘත කළ යුතුය***

*7.1.1 රාජ්‍ය වෙබ් ද්වාරය (www.gov.lk) සහ රාජ්‍ය ජංගම ද්වාරය (www.mobile.srilanka.lk) ඒකාබද්ධ අන්තර්ජාලය පදනම් පද්ධති වන අතර ඉන් නවතම සහ පුළුල් පරාසයක තොරතුරු සහ පුරවැසි සේවා සහ රාජ්‍ය තොරතුරු ලද හැකිව සලස්වයි. සියලුම රාජ්‍ය සංවිධාන රාජ්‍ය සහ දේශ ද්වාර මත සබැඳි මාර්ගයෙන් තම ලද හැකි ඉලෙක්ට්‍රොනික් සේවා කරා ප්‍රවේශය ගත හැකි බවට තහවුරු කරගත යුතුය.*

*7.1.2 රාජ්‍ය සංවිධාන විසින් පුරවැසියන්ට තොරතුරු සැපයීම සඳහා ත්‍රෛභාෂික පදනමකින් පුරවැසියාට මිත්‍රශීලී වන ආකාරයෙන් වෙබ් අඩවියක් සංවර්ධනය කර නඩත්තු කළ යුතුය. (21 වන ඇමුණුම – රාජ්‍ය වෙබ් වසම් ලියාපදිංචිකරණ ප්‍රතිපත්තිය සහ 22 වන ඇමුණුම – රාජ්‍ය වෙබ් ප්‍රමිති සහ මෙහෙයුම් නිර්ණායක පරිශීලනය කරන්න)*

*7.1.3 රාජ්‍ය සංවිධාන තම වෙබ් අඩවිය මත අන්තර්ගතය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලද හැකි බව තහවුරු කළ යුතුය. දේශීය භාෂාවලින් තිබෙන වෙබ් පිටු යුනිකෝඩ සඳහා අනුකූල විය යුතුය. මේවා සතුව යාවත්කාල සඳහා අන්තර්ගතය කළමනාකරණ මෙවලමක්, වෙබ් ප්‍රමිති සහ මෙහෙයුම් නිර්ණායක සහ රාජ්‍ය වසම් නාම ප්‍රතිපත්තිය පිළිපැදීමක් සහිත විය යුතුය (21 වන ඇමුණුම – රාජ්‍ය වෙබ් වසම් ලියාපදිංචිකරණ ප්‍රතිපත්තිය පරිශීලනය කරන්න).*

### 7.2 ඩිජිටල් රජය මාර්ගයෙන් වැඩිදියුණු කළ ප්‍රතිචාරාත්මක ගුණය

***ප්‍රතිපත්ති ප්‍රකාශය - කාලීනව ප්‍රතිචාරාත්මක සහ අන්තර් ක්‍රියාකාරී වනු පිණිස රාජ්‍ය සංවිධාන මගින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිත කළ යුතුය***

*7.2.1 බාහිර සංවිධාන සමඟ සන්නිවේදනය කරන විට ඊමේල් පහසුකම් දිය යුත්තේ කාටදැයි සංවිධානයේ ප්‍රධානියා විසින් තීරණය කළ යුතුය.*

*7.2.2 සෑම රාජ්‍ය සංවිධානයක් මගින්ම සපයන විද්‍යුත් මාර්ගගත සේවා ක්‍රියාත්මක කෙරෙන සේවාවල ස්වභාවය අනුව ඉහළ ලද හැකියාවක් තහවුරු කළ යුතුය.*

*7.2.3 සියලුම රාජ්‍ය සංවිධාන රාජ්‍ය ඊමේල් ප්‍රතිපත්තිය පිළිපැදිය යුතුය (23 වන ඇමුණුම – රාජ්‍ය ඊමේල් ප්‍රතිපත්තිය පරිශීලනය කරන්න).*

## 8 වන කොටස - 8 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

## යහපත් රාජ්‍ය පාලන ඉලක්ක - සහභාගිත්ව, ගිවිස්න දිශාගත

***8 වන පරමාර්ථය - අනුමැතිය ලබන විටක ගිවිස්න දිශාගත, පොදු ප්‍රතිපත්තිය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ඉලෙක්ට්‍රොනික් මාර්ගවලින් පුරවැසි නිරතවීම් සබල කිරීම***

*<u>කොටසේ උප මාතෘකා</u>*

**8.1 ඩිජිටල් රජය මාර්ගයෙන් පුරවැසි නිරතවීම**

**8.2 පුරවැසි නිරතවීමෙහි ප්‍රතිඵල දෘශ්‍යමාන වීම**

### 8.1 ඩිජිටල් රජය මාර්ගයෙන් පුරවැසි නිරතවීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - සෑම රාජ්‍ය සංවිධානයක් සතුවම අනුමැතිය ලබන විටක ගිවිස්න දිශාගත, පොදු ප්‍රතිපත්තිය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පුරවැසියන්ට නිරතවීමට ඉලෙක්ට්‍රොනික් මාර්ග තිබිය යුතුය***

*8.1.1 සියලුම රාජ්‍ය සංවිධාන සතුව ඔවුන්ගේ වෙබ් අඩවිය මත අතෘප්තිය, පැමිණිලි, අදහස්, මත, අනු සටහන්, නිරීක්ෂණ ආදිය අත්කර ගැනීම සඳහා වෙන් වූ කොටසක් තිබිය යුතු අතර එමගින් පුරවැසියන්ගේ සක්‍රීය සහභාගිත්වය/දායකත්වය තහවුරු කළ යුතුය. පුරවැසියන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය නාලිකා වැඩි ගණනක් මාර්ගයෙන් සහභාගිත්වය සැලසූ එකක් විය යුතුය.*

*8.1.2 ප්‍රතිපත්ති, සැලසුම් සහ අයවැය සූත්‍රගත කරන විට, සාකච්ඡා සංසද, ඊමේල්, බ්ලොග් අඩවි, සමාජ මාධ්‍ය වැනි විද්‍යුත් මාර්ග අදාළ විෂයය පිළිබඳව පුළුල් ජනතා උපදේශකත්වයක් අත්කර ගැනීම සඳහා ආදාන සහ සාකච්ඡා වලට පහසුකම් සැපයිය යුතුය. (24 වන ඇමුණුම – රාජ්‍ය සමාජ මාධ්‍ය මෙහෙයුම් නිර්ණායක පරිශීලනය කරන්න)*

*8.1.3 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම අළුත් ව්‍යාපෘති හෝ ප්‍රධාන ක්‍රියාකාරකම් මූලාරම්භ කිරීමට පෙරාතුව අතෘප්තිය, පැමිණිලි, අදහස්, මත, අනු සටහන්, සහ නිරීක්ෂණ අත්කර ගැනීම සඳහා මාර්ග සලසා තිබිය යුතුය.*

*8.1.4 රජයේ වෙන් කළ පුරවැසි නිරත ද්වාරය වන "රජයේ නිල ඉ-සහභාගිත්ව ද්වාරය" සියලුම රජයේ සංවිධාන විසින් මෙම අරමුණ සඳහා භාවිත කළ යුතුය.*

### 8.2 පුරවැසි නිරතවීමෙහි ප්‍රතිඵල දෘශ්‍යමාන වීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය - ගන්නා ලද නිවැරදි කිරීම්/පසුවිපරම් ක්‍රියාමාර්ග අනුමැතිය ලබන විටක ඉලෙක්ට්‍රොනික් මාර්ග ඔස්සේ පුරවැසියන්ට දෘශ්‍යමාන වීමට සැලැස්විය යුතුය***

*8.2.1 සංවිධානයේ ප්‍රධානියා පුරවැසියන්ගෙන් අත්කර ගන්නා අත්‍යුප්තිය, පැමිණිලි, අදහස්, මත, අනු සටහන්, නිරීක්ෂණ ආදිය සම්බන්ධයෙන් සමාලෝචන කිරීමට සහ යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මූලික පුද්ගලයෙකු හෝ ඒකකයක් පත් කළ යුතුය.*

*8.2.2 පුරවැසි නිරතවීම් සඳහා භාවිත කරන යන්ත්‍රණ පුරවැසි නිරතවීමෙහි ප්‍රතිඵල පිළිබඳව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය.*

## 9 වන කොටස - 9 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

## යහපත් රාජ්‍ය පාලන ඉලක්ක - නීතියේ ආධිපත්‍යය

## 9 වන පරමාර්ථය - *තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිත කිරීම මගින් නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම*

*<u>sකොටසේ උප මාර්තෘකා</u>*

**9.1 නීතිය කඩකිරීම් අධීක්ෂණය කිරීම සඳහා වන ඩිජිටල් රජය**

### 9.1 නීතිය කඩකිරීම් අධීක්ෂණය කිරීම සඳහා වන ඩිජිටල් රජය

***ප්‍රතිපත්ති ප්‍රකාශය - රාජ්‍ය සංවිධාන ඔවුනට ලැබී ඇති බලය ප්‍රකාරව නීතිය කඩකිරීම් අධීක්ෂණය කිරීම, සෝදිසියෙන් සිටීම, සහ ග්‍රහණය කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මැදිහත් කරගත යුතුය***

*9.1.1 ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සපුරා ගැනීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධති සංවර්ධනය කරන විට, කිසියම් නීතිය කඩකිරීමක් අනාවරණය කිරීම, සෝදිසියෙන් සිටීම, සහ අධීක්ෂණය කිරීම තහවුරු කිරීම සඳහා විශේෂාංග සංස්ථාපනය කිරීමට විශේෂ අවධානයක් යෙදවිය යුතුය.*

### 9.2 නීතිය කඩකිරීම් වාර්තාකරණය සඳහා යන්ත්‍රණ

***ප්‍රතිපත්ති ප්‍රකාශය - පුරවැසියන් විසින් නීතිය කඩකිරීම් වාර්තාකරණය සඳහා පහසුකම් සැලසීමට රාජ්‍ය සංවිධාන විසින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යොදාගත යුතුය***

*9.2.1 නීතිය කඩකිරීම් සම්බන්ධයෙන් පුරවැසියන් විසින් සපයන තොරතුරු ග්‍රහණය කර ගැනීම සඳහා පද්ධති මගින් පහසුකම් සලසා තිබිය යුතුය.*

*9.2.2 තනි පුද්ගල අවශ්‍යතාවලට වඩා පොදු යහපැවැත්ම සඳහා මෙම පද්ධති භාවිත කිරීමට පුරවැසියන් ධෛර්යමත් කළ යුතුය*

## 10 වන කොටස - 10 වන පරමාර්ථය සඳහා ප්‍රතිපත්ති

## යහපත් රාජ්‍ය පාලන ඉලක්ක - ඵලදායකත්වය, කාර්යක්ෂමතාව

## 10 වන පරමාර්ථය – සාර්ථක ඩිජිටල් රාජ්‍ය පාලනයක් සඳහා නියමාකාර සබලිත මෙහෙයුම් ව්‍යුහරාමුවක් සංස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම

***<u>කොටසේ උප මාතෘකා</u>***

**10.1 CIO/ICT ඒකකය**

**10.2 ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති පාලනය**

**10.3 ප්‍රසම්පාදනය**

**10.4 අන්තර්ජාලය/අන්තඃජාලය**

**10.5 මානව සම්පත් ධාරිතා ගොඩනැගීම**

**10.6 ඩිජිටල් රාජ්‍ය පාලනය සඳහා විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතය**

**10.7 ඩිජිටල් රාජ්‍ය පාලන ව්‍යාපෘති අධීක්ෂණය සහ අගැයීම**

### 10.1 CIO/ICT ඒකකය

***ප්‍රතිපත්ති ප්‍රකාශය – සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම ඩිජිටල් රාජ්‍ය පාලනය සඵලකව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන නවෝත්පාදන නිලධාරියෙකු පත් කළ යුතු අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකයක් පිහිටුවිය යුතුය***

*10.1.1 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම ප්‍රධාන නවෝත්පාදන නිලධාරියෙකු* (CIO) *පත් කළ යුතුය. ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා* ICTA *හි රාජ්‍ය වැඩ සටහන ප්‍රත්‍යාවර්ත ඉංජිනේරු කටයුතු කිරීමේ දී සංවිධානයේ ඉලක්කගත පුද්ගලයා විය යුතුය. ඔහු/ඇය සංවිධානයේ ධුරාවලිය අනුව දෙවන පෙළ නිලධාරියෙකු විය යුතු වන අතර සංවිධානයේ ප්‍රධානියාට වාර්තා කරන, අමාත්‍යාංශයක නම් ලේකම්වරයාට වාර්තා කරන නිලධාරියෙකු විය යුතුය. ඔහු/ඇය* ICT *ඒකකයේ ප්‍රධානියා විය යුතු අතර සංවිධානයේ මධ්‍යම ව්‍යාපාරික හරය සහිත යටත් පිරිසෙයින් තොරතුරු සහ සන්නිවේදන දැනුම අතින් අවම මට්ටමටවත් දැනුමක් සහිත අයෙකු විය යුතුය.*

*10.1.2 ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා සංවිධානය ඇතුළත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වගකිව යුතු වන අතර, රාජ්‍ය සංවිධාන අනෙකුත් සංවිධාන සමඟ අන්තර්සම්බන්ධිත වන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ වැඩ සටහන් සහ ව්‍යාපෘති පිළිබඳ අතරමැදියා විය යුතුය. ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා ඩිජිටල් රජය වැඩ සටහනේ සංවිධානයේ ක්‍රියාත්මක කිරීම පිළිබඳව*

*සම්බන්ධීකරණය කළ යුතු වන ICTA හි නම් කරන ලද නිලධාරියා සමඟ යටත් පිරිසෙයින් සෑම මාස තුනකට (3) වරක්වත් හෝ අවශ්‍ය වන විටක සම්බන්ධ විය යුතුය.*

*10.1.3 ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා සංවිධානයට තාක්ෂණික දිශානතිය සැපයිය යුතුය. එසේ කරනු පිණිස ඔහු/ඇය ඩිජිටල් රජය වර්තමාන ප්‍රවීණතා මට්ටම හඳුනා ගැනීම සහ ඩිජිටල් රජය ප්‍රවීණතා මට්ටම වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් සංවර්ධනය කරන ලද ඩිජිටල් රජය ප්‍රවීණතා තක්සේරුකරණ මෙවලම භාවිත කළ යුතුය.*

*10.1.4 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම සංවිධානය ඇතුළත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකයක් පිහිටුවිය යුතුය. සංවිධානයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම්/ව්‍යාපෘති බාහිර පාර්ශ්ව කරා යවා ක්‍රියාත්මක කරවා ගැනීම අනුව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකයේ තරම සහ ව්‍යුහය විවිධ විය හැකිය.*

*10.1.5 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය සංවිධානයේ තොරතුරු සහ සන්නිවේදන මෙහෙයුම්, පිටත සම්පත් හරහා කරවා ගන්නා තොරතුරු සහ සන්නිවේදන ව්‍යාපෘති සඳහා වගකිව යුතු වන අතර එවැනි ව්‍යාපෘතිවල ජීවන චක්‍රය කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු වන්නේය. පහත සඳහන් කණ්ඩායම් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකයේ ප්‍රධානියා වෙත වාර්තා කළ යුතුය: තාක්ෂණික මෙහෙයුම්, ව්‍යාපෘති කළමනාකරණය සහ පිටතට දී කරවා ගැනීම, සැලසුම්කරණය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති, ව්‍යාපාරික මෙහෙයුම්, සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් සඳහා පිටස්තර සේවා සපයන්නන්. ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා වර්ෂ 2016 වන විට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු වන්නේය.*

## 10.2 ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති පාලනය

### *ප්‍රතිපත්ති ප්‍රකාශය – සියලුම ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සඳහා ගැළපෙන මෘදුකාංග පාලන ව්‍යුහරාමුවක් ක්‍රියාත්මක කිරීම*

*10.2.1 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම සංවිධානයෙහි දැක්ම සහ මෙහෙවර අවබෝධ කර ගැනීමේ දී භාවිත කළ යුතු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මාවතක් පැහැදිලි කරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ වාර්ෂික සැලසුමක් කෙටුම්පත් කර ක්‍රියාවේ යෙදවිය යුතුය. ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා සංවිධානය වෙනුවෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සැලසුම කෙටුම්පත් කර ක්‍රියාවේ යෙදවීම සඳහා වගකිව යුතු වේ.*

*10.2.2 සියලුම රාජ්‍ය සංවිධාන තම වාර්ෂික තොරතුරු සහ සන්නිවේදන සැලසුම් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතු වන අතර සැලසුම් සකස් කිරීමේ අවසානයට පෙරාතුව නිර්දේශ ලබා ගත යුතුය. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පිළිබඳ අන්තර් අමාත්‍යාංශ කමිටුව මගින් අධීක්ෂණය කරනු ඇත.*

*10.2.3 All government organizations should submit their annual ICT plans to ICTA and obtain the recommendations prior to proceed with finalizing the plans. Implementation of ICT plans will be monitored by Inter-Ministerial Committee for ICT.*

*10.2.4 සෑම රාජ්‍ය සංවිධානයක් විසින්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන සඳහා තම වාර්ෂික අයවැයෙන් සුදුසු පරිදි අරමුදල් වෙන් කළ යුතු වන අතර පවත්නා උපකරණ, පද්ධති සහ ජාල නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කළ යුතුය. පිරිවැය ඇස්තමේන්තු කිරීමේ සහ එවැනි ඇස්තමේන්තු සඳහා නිර්දේශ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් ලබා ගත හැකිය.*

*10.2.5 ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන හැමවිටක දීම, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් සූත්‍රගත කර සංස්ථාපනය කළ යුතු වන අතර කොටස්කරුවන්ගේ කැපවීම, සහභාගිත්වය, සහයෝගය සහ සහයෝගී වැඩ තහවුරු කළ යුතුය; අමාත්‍යාංශ ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විශේෂිත ඉලක්ක සමඟ අදාළ නියමයන් කට්ටලයක් සහිතව කමිටුව පත් කළ යුතුය. 25 වන ඇමුණුම - සංකල්ප ලේඛනය සඳහා අච්චු ආකෘතිය, 26 වන ඇමුණුම - රාජ්‍ය සේවා කොමිෂමේ නියමයන් සඳහා අච්චු ආකෘතිය.*

*10.2.6 ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම පිණිස, රාජ්‍ය සංවිධාන විසින් යෝග්‍ය මෘදුකාංග පාලන ව්‍යුහරාමුවක් අදාළ කරගෙන ක්‍රියාත්මක කළ යුතුය. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් කෙටුම්පත් කර ඇති මෘදුකාංග පාලන ව්‍යුහරාමුව අවශ්‍ය කරන නවීකරණ/වැඩිදියුණු කිරීම් සහිතව භාවිත කිරීමට නිර්දේශ කෙරේ (27 වන ඇමුණුම - මෘදුකාංග පාලන ව්‍යුහරාමුව පරිශීලනය කරන්න). මෘදුකාංග පාලන ව්‍යුහරාමුවෙහි අනිවාර්ය කොටස, සියලුම සංවිධාන සඳහා ස්වාධීන මෘදුකාංග ව්‍යාපෘති විගණනයක් කිරීම අත්‍යවශ්‍ය වේ.*

*10.2.7 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති හා බැඳී වැඩ කරන සේවානියුක්තිකයන් සංවිධානය ඇතුළත හෝ සංවිධාන අතර මාරු කිරීම/විශ්‍රාම ගැනීම සිදුවන විට ව්‍යාපෘතිවල අඛණ්ඩතාව තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.*

*10.2.8 මූලික ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතිවල කාර්ය භාර නිලධාරීන් "ඡායා" නිලධාරියෙකු පත් කළ යුතු වන අතර ඔහු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතියේ සියලුම පැතිකඩ පිළිබඳව අවදියෙන් සිටීම අවශ්‍ය වනු ඇත. ව්‍යාපෘතියක සාර්ථක ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තීරණාත්මක කුසලතා සම්පන්න සේවානියුක්තිකයෙකු මාරු කිරීම/සංවිධාන හැර යාම, හෝ උසස්වීම සිදු වන්නේ නම්, ඔහු/ඇය සමාන කුසලතා සහිත නිලධාරියෙකු යොදවා ප්‍රතිස්ථාපනය කළ යුතු අතර, හැකියාවක් තිබේ නම්, "ඡායා" නිලධාරියා එතැනට ගෙන ආ යුතුය.*

*10.2.9 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ හා සම්බන්ධ නිලධාරියෙකු මාරු කරන විට, රාජ්‍ය සංවිධානය රාජකාරි ආපසු බාරදීම සඳහා කාලයක් තිබෙන බවට තහවුරු කරගත යුතුය.*

*10.2.10 රාජ්‍ය සංවිධාන විසින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිවල අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා සහ අවශ්‍ය මට්ටමේ සහ අවශ්‍ය කාලය තුළ තොරතුරු ලද හැකියාව තහවුරු කිරීම සඳහා සැලසුමක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.*

## 10.3 ප්‍රසම්පාදනය

***ප්‍රතිපත්ති ප්‍රකාශය – රාජ්‍ය සංවිධාන නියම ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, මෙහෙයුම් නිර්ණායක සහ පරිචයන් පිළිපැදිය යුතුය***

*10.3.1 රජය වෙනුවෙන් බාහිර සැපයුම්කරු(වන්) විසින් කරන මෘදුකාංග සංවර්ධන කටයුතු ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව පමණක් කළ යුතුය. තීරණාත්මකව වැදගත් වන විශේෂ ක්ෂේත්‍ර මෘදුකාංග පාලන ව්‍යුහරාමුව තුළ සඳහන් කළ යුතුය. වැඩිදුර විස්තර සඳහා මෘදුකාංග පාලන ව්‍යුහරාමුව (27 වන ඇමුණුම) තුළ උපදේශකත්ව ගිවිසුම් නිදර්ශනය පරිශීලනය කරන්න.*

*10.3.2 "රාජ්‍ය වැඩ සටහන ප්‍රත්‍යාවර්තී ඉංජිනේරු කටයුතු කිරීම" පිළිබඳ ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද සහ 2006 සැප්තැම්බර් 13 වන දා අනුමත කරන ලද පත්‍රිකාව ප්‍රකාරව, සියලුම රාජ්‍ය නියෝජිතායතන කිසියම් විශාල මෘදුකාංග ව්‍යාපෘතියක් (රු. මිලියන 2කට වැඩි), (අ) සියලුම රාජ්‍ය නියෝජිතායතනවලට අදාළ කරගත හැකි විශේෂයෙන් අන්තර් මෙහෙයුම් හැකියා සහ දේශීයකරණ අවශ්‍යතා සම්බන්ධ පොදු ප්‍රමිති සමඟින් අනුකූල වන බව තහවුරු කිරීම, සහ (ආ) එවැනි ව්‍යාපෘති රාජ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතිය සමඟ සම්පූර්ණයෙන් ඒකාබද්ධ කළ හැකි බව තහවුරු කිරීම, කරා යොමුවීමට පෙරාතුව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් උපදෙස් ලබාගත යුතුය. ගණිය දෘඩාංග ප්‍රසම්පාදනය පිළිබඳ තාක්ෂණික පිරිවිතර සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වෙබ් අඩවිය මත -සබැඳිය- පරිශීලනය කරන්න.*

*10.3.3 තාක්ෂණික ඇගැයීම් කමිටුවේ (TEC) සංයුතිය: විශාල තොරතුරු සහ සන්නිවේදන ව්‍යාපෘති (රුපියල් මිලියන 10 ඉක්මවන, ව්‍යවසාය මට්ටමේ විසඳුම්) සංයුතියට ICTA විසින් නම් කරන එක් පුද්ගලයෙකු ඇතුළත් විය යුතුය. මේ සම්බන්ධයෙන් රාජ්‍ය සංවිධානය විසින් පුද්ගලයෙකු නම් කරන ලෙස ICTA වෙතින් ඉල්ලීමක් කළ යුතුය.*

*10.3.4 තොරතුරු පද්ධති, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික උපකරණ, මෘදුකාංග, මෘදුකාංග සංවර්ධන, සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, හෝ එහි කිසියම් අනුප්‍රාප්තික ආයතනයක, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය මගින් ප්‍රසිද්ධ කළ "ප්‍රසම්පාදන අත්පොත සහ මෙහෙයුම් නිර්ණායක" හි අදාළ වගන්ති ප්‍රකාරව කළ යුතු වේ. ප්‍රසම්පාදනයෙහි මෙහෙයුම් පැතිකඩ හා සම්බන්ධ මාර්ගෝපදේශනය ICTA වෙතින් ලබාගත හැකිය.*

*10.3.5 රජයේ කටයුතුවල දී මෘදුකාංග යෙදුම් භාවිතය සහ සංවර්ධනය සඳහා විවෘත මූලාශ්‍ර මෘදුකාංග මූලධර්ම මගින් පිරිවැය සාධක පිරිනැමීම් ලබා දෙයි. එම නිසා, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සඳහා විවෘත මූලාශ්‍ර පදනම් යෝජනා ඉදිරිපත් කිරීමට පහසුකම් සැපයිය යුතුය. මූල්‍ය යෝජනා අගැයීමේ දී, පිරිවැය සාධක යෝජනා තක්සේරු කිරීම පිණිස අවම වශයෙන් අවුරුදු 5ක ආයෝජන ප්‍රතිලාභ අගය කළ යුතුය (10 වන ඇමුණුම – ආයෝජන ප්‍රතිලාභ ආගණනය සඳහා අච්චු ආකෘතිය).*

*10.3.6 රාජ්‍ය සංවිධාන බලපත්‍ර ප්‍රදානය කරන මෘදුකාංග පමණක් භාවිත කළ යුතුය; එවැනි බලපත්‍ර හිමිකාරිත්ව මෘදුකාංග හෝ විවෘත මූලාශ්‍ර මෘදුකාංග සඳහා විය හැකිය. වලංගු බලපත්‍රයක් නොමැතිව මෘදුකාංග භාවිත කිරීම බලපත්‍ර කොන්දේසි නොසලකමින් බලපත්‍ර ප්‍රදානිත මෘදුකාංගවලට නවීකරණය කිරීම සහ රිසිකරණය 2003 බුද්ධිමය දේපළ පනතට*

*විසංවාදී විය හැකි වන අතර නෛතික දඬුවලින් ප්‍රතිඵලය වනු ඇත (අපරාධ සහ සිවිල් බැඳියාවන් දෙකම පරිදි).*

*10.3.7 රජය සඳහා මෘදුකාංග විසඳුම් සංවර්ධනය කිරීමේ දී, බුද්ධිමය දේපළ අයිතිය රජයට හිමි බව තහවුරු කරන පරිදි කිරීමට උපරිම ප්‍රයත්න දැරිය යුතුය. මුල සිටම මෘදුකාංග සංවර්ධනය කිරීමේ දී මෙය බෙහෙවින්ම අදාළ වේ. මුල පටන්ම ඩිජිටල් රාජ්‍ය විසඳුමක් සංවර්ධනය කිරීම සඳහා විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිත කරන විට හෝ ලද හැකි විවෘත මූලාශ්‍ර නිෂ්පාදනයක් භාවිත කිරීමේ දී, සම්පූර්ණ බුද්ධිමය දේපළ අයිතිවාසිකම රාජ්‍ය සංවිධානයට හිමිවන පරිදි කළ යුතුය. ඩිජිටල් රාජ්‍ය විසඳුම්වල බුද්ධිමය අයිතිය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා මෘදුකාංග පාලන ව්‍යුහරාමුවෙහි බුද්ධිමය දේපළ අයිතිය යටතේ ඇති කොටස කියවන්න (27 වන ඇමුණුම - මෘදුකාංග පාලන ව්‍යුහරාමුව පරිශීලනය කරන්න).*

*10.3.8 වැඩතල පරිගණක මත මෘදුකාංග ස්ථාපනය කිරීම් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් උල්ලංඝනය නොකළ යුතුය. වැඩතල පරිගණක මත මෘදුකාංග ස්ථාපනය කිරීමට අධිකාරය ඇත්තේ පද්ධති පරිපාලක හෝ අනුමත පුද්ගලයෙකුට පමණි.*

*10.3.9 නිලධාරීන්ට ලබා දී ඇති වැඩතල පරිගණක, උකුළු පරිගණක සහ අතේ ගෙන යාහැකි උපාංග අදාළ නිල කාර්යයට පමණක් භාවිත කිරීම නිර්දේශිතයි.*

*10.3.10 ඩිජිටල් රජය සඳහා දියුණු ව්‍යාපාරික මොඩලයක් මගින් රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වයක් දිරිමත් කරනු ලැබේ. PPP පදනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් නිර්ණායක කට්ටලයක් 28 වන ඇමුණුම - PPP පදනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් නිර්ණායක තුළ අඩංගු වේ.*

## 10.4 අන්තර්ජාලය/අන්තඃජාලය

***ප්‍රතිපත්ති ප්‍රකාශය – යෝග්‍ය ආරක්ෂක ප්‍රතිපත්ති අදාළ කර ගැනීම මගින් රාජ්‍ය සංවිධාන තම අන්තර්ජාලය සහ අන්තඃජාලය භාවිත කිරීමේ දී ආරක්ෂාව තහවුරු කරගත යුතුය***

*10.4.1 අන්තර්ජාලය/අන්තඃජාලය භාවිතය පිළිබඳව පරිශීලකයන්ට මග පෙන්වනු පිණිස සංවිධානය විසින් අන්තර්ජාල/අන්තඃජාල භාවිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය. අන්තර්ජාල භාවිතය සංවිධානයෙහි පැවතුම් සංග්‍රහයේ ආචාර සහ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය.*

*10.4.2 භෞතික ලිපි ගොනු සඳහා අදාළ තොරතුරු ප්‍රවේශ සීමා කිරීම් වඩාත් යහපත් විගණන පිළිවෙතක් සහ අන්තඃජාලය තුළ ලද හැකිව පවතින තොරතුරු වල ආරක්ෂාව සඳහා ද අදාළ විය යුතුය.*

*10.4.3 LAN ගිණුම් සංවිධානයේ කළමනාකරණ නිශ්කාශනයෙන් පසුව පමණක් නිර්මාණය කළ යුතු අතර සේවානියුක්තිකයා සංවිධානය හැර යන දාම අබල කළ යුතුය.*

*10.4.4 රාජ්‍ය සංවිධාන විසින් LAN ගිණුම් සඳහා සම්මත ආකෘතියක් සහ වැඩතල පරිගණකවල නම් සහ ජාලය තුළ සේවාදායක නාමකරණය අනුව ඒවා නිර්වචනය කළ යුතුය.*

*10.4.5 ආපදාවක් හෝ මාධ්‍ය අසාර්ථකත්වයක් හේතුවෙන් පසුව සියලුම අත්‍යවශ්‍ය තොරතුරු සහ මෘදුකාංග පිළිනැගීමට හැකි වනු පිණිස යෝග්‍ය උපස්ථකරණ පහසුකම් සලසා තිබිය යුතුය.*

*10.4.6 ලංකා රාජ්‍ය තොරතුරු සහ යටිතල පහසුකම්* (LGII) *රාජ්‍ය අයිතිය පවතින සමාගම ලංකා රාජ්‍ය ජාලය* (LGN) *කළමනාකරණය කිරීම සඳහා,* LGII *ජාල මෙහෙයුම් කේන්ද්‍රය* (NOC) *නඩත්තු කරන අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණ කාර්ය මණ්ඩලයක් යොදවා ඇති උපකාර කවුළුවක් තාක්ෂණික උපදේශනය සහ සහයෝගය (උදා. දෘඩාංග, මෘදුකාංග, ජාලකරණය සහ සන්නිවේදනය) රාජ්‍ය සංවිධානවලට අවශ්‍ය කරන විටක ලබා දෙනු පිණිස විවෘතව තිබේ. ලංකා රාජ්‍ය ජාලයට සම්බන්ධිත සියලුම රාජ්‍ය සංවිධාන ජාල මෙහෙයුම් කේන්ද්‍රය සහ ඔවුන්ගේ ලංකා රාජ්‍ය ජාල සම්බන්ධ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට උපකාර කවුළුවක් මගින් සලසන සේවය භාවිත කළ යුතුය.*

*10.4.7 සෑම රාජ්‍ය සංවිධානයක්ම ලංකා රාජ්‍ය ජාල ප්‍රතිපත්තිවලට අමතරව, අන්තර්ජාල ප්‍රවේශය පැවරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා තමන්ගේම ප්‍රතිපත්ති සතුව තබා සිටිය යුතු වන අතර රාජ්‍ය තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය **(යොමුව)** තුළ විශේෂණය කර ඇති මෙහෙයුම් නිර්ණායක අනුගමනය කළ යුතුය.*

## 10.5 මානව සම්පත් ධාරිතා ගොඩනැගීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය – සියලුම රාජ්‍ය සංවිධාන සාර්ථක ඩිජිටල් රාජ්‍ය ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය***

*10.5.1 රාජ්‍ය සංවිධාන විසින් වාර්ෂික පදනමක් මත සංවිධානමය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩලවලට අවශ්‍ය කුසලතා සහ පුහුණුව තක්සේරුවක් කළ යුතුය. සංවිධානයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සැලසුම්කරණයට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ සේවානියුක්තිකයන් පුහුණු කිරීම පිළිබඳ සංරචකයක් අඩංගු කළ යුතුය.*

*10.5.2 රාජ්‍ය සංවිධානවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ මධ්‍යම මට්ටමේ කළමනාකරණය ඇතුළු කාර්ය මණ්ඩල ඔවුන්ගේ දෛනික වැඩවල දී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිත කිරීමේ දී ප්‍රවීණ විය යුතු වන අතර ඔවුනට මෙම ප්‍රවීණතාව අත්කර ගැනීම සඳහා අවශ්‍ය අවදිමත් භාවය සහ පුහුණුව සැපයිය යුතුය.*

*10.5.3 ජ්‍යෙෂ්ඨ කළමනාකරණය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙහි ප්‍රවීණ සහ / හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සුදුසුකම් අත්කර ගන්නා කාර්ය මණ්ඩලය සඳහා යෝග්‍ය දිරිදීමනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය.*

*10.5.4 රාජ්‍ය සංවිධානවල සියලුම කාර්ය මණ්ඩල රජය අනුමත කළ පරිගණක සුදුසුකම් අත්කර ගැනීම සඳහා දිරිමත් විය යුතුය.*

*10.5.5 රාජ්‍ය සංවිධාන විසින් ප්‍රධාන නවෝත්පාදන නිලධාරීන් ඩිජිටල් රජය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගන්නා බවට තහවුරු කර ගත යුතුය. අවම ප්‍රවීණතාවේ සිටින ප්‍රධාන නාවෝත්පාදන නිලධාරීන් ඩිජිටල් රජය සහිතක පත්‍ර සුදුසුකම ලබාගත යුතුය. eGov PGDip, MBA (eGov) වැනි අතිරේක සුදුසුකම් ඉහළින්ම නිර්දේශ කරනු ලැබේ. ඉහත සඳහන් දේට අතිරේකීව, ප්‍රධාන නවෝත්පාදන නිලධාරීන් නව සංකල්ප, උපනති, තාක්ෂණ ආදියෙහි දැනුම අත්කර ගැනීම සඳහා ඩිජිටල් රජය සම්බන්ධ වැඩමුළු සහ සම්මේලන වලට සහභාගී විය යුතුය.*

*10.5.6 රාජ්‍ය සංවිධාන සඳහා නියම ඩිජිටල් රජය ධාරිතා ගොඩනැගීම ක්‍රියාත්මක කරනු පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් සංවර්ධනය කරන ලද ධාරිතා ගොඩනැගීමේ ව්‍යුහරාමුව භාවිත කළ හැකිය. එයින් පුහුණු අවශ්‍යතා තක්සේරුකරණය සඳහා පහසුකම් සලසනවා මෙන්ම සංවිධානයේ සෑම නිලධාරියෙකු සඳහාම ධාරිතා ගොඩනැගීමේ වැඩ සටහන් සඳහා පහසුකම් සලසයි.*

## 10.6 ඩිජිටල් රජය විසඳුම් සඳහා විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිත කිරීම

***ප්‍රතිපත්ති ප්‍රකාශය – රාජ්‍ය සංවිධාන විසින් ඩිජිටල් රජය විසඳුම් සංවර්ධනය කිරීම සඳහා පළමු විකල්පය ලෙස විවෘත මූලාශ්‍ර, රාජ්‍ය කටයුතු සඳහා ඒවායේ ප්‍රතිලාභ සනාථ වී ඇති බැවින්, භාවිත කිරීම සලකා බැලිය යුතුය. විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිත කිරීමේ ප්‍රතිලාභ 29 වන ඇමුණුම යටතේ ලැයිස්තුගත කර ඇත.***

*10.6.1 විවෘත මූලාශ්‍ර විසඳුමක් සංවර්ධනය කිරීම සහ/හෝ මිලදී ගැනීමට පෙරාතුව කර්මාන්ත හැකියාව සහ පළපුරුද්ද සලකා බැලිය යුතුය.*

*10.6.2 ආයෝජන ප්‍රතිලාභ 3.1 යටතේ ප්‍රකාශිත මෙහෙයුම් නිර්ණායක පරිදි ආගණනය කළ යුතුය.*

*10.6.3. ඩිජිටල් රජය හි මුළු ආයෝජන ප්‍රතිලාභ තහවුරු කිරීමට රජයට අවශ්‍ය වන හැම විටකම විසඳුම රජය සමඟම පවතින අතර, විවෘත මූලාශ්‍ර පදනම් කරගත් විසඳුම් රජයේ කාර්යයක් ලෙස පවතියි, එවැනි අවස්ථාවල දී මූල කේත අනුව සංවර්ධනය කරන විවෘත මූලාශ්‍ර පදනම් කරගත් විසඳුම් රජයට අයත් වන පරිදි කටයුතු කළ යුතුය. මෙය මෘදුකාංග සංවර්ධනය සඳහා වන ගිවිසුමෙන් තහවුරු කළ යුතුය.*

*10.6.4 රාජ්‍ය සංවිධාන විසින් විවෘත මූලාශ්‍ර නිෂ්පාදන ලද හැකියාව සහ තම අවශ්‍යතා සපුරාලන පරිදි එවැනි නිෂ්පාදන නවීකරණය පිළිබඳව පර්යේෂණ කළ යුතුය. ඊමේල්, වෙබ් පිරික්සුම, ලේඛන කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, අන්තර්ගතය කළමනාකරණය, වෙබ් අඩවි සංවර්ධනය ආදිය සඳහා ඉහළින්ම හඳුනා ගැනුණු සහ පුළුල්ව භාවිත කරන විවෘත මූලාශ්‍ර මෘදුකාංග ලද හැකිය. අවශ්‍ය කරන නොමිලේ සහ විවෘත මූලාශ්‍ර මෘදුකාංග සොයා ගැනීම සඳහා පර්යේෂණ කරගෙන යාම පිණිස ලද හැකි හොඳම මූලාශ්‍ර නම් source forge (link), govforge (link), (link) සඳහා විකල්ප ආදියයි.*

*10.6.5 රාජ්‍ය LGN පරිශීලකයන් සඳහා LGII මගින් ඇසුරුම් කරන විවෘත මූලාශ්‍ර මෙහෙයුම් පද්ධතිය වන eSri Lanka OS භාවිත කිරීමට නිර්දේශ කෙරේ. මෙම මෘදුකාංග ඇසුරුමට කාර්යාල ඵලදායිතා මෙවලම් සහ රාජ්‍ය පරිශීලකයන්ට වර්තමානයේ අවශ්‍ය මෘදුකාංග හැම එකක්ම ඇතුළත් වේ. මෘදුකාංග අත්කර ගැනීම මෙන්ම eSri Lanka OS භාවිත කිරීමේ දී සහය ලබා ගනු පිණිස LGII උපකාර කවුළුව (2 telnoxxx) හා සම්බන්ධ වන ලෙස උපදෙස් දෙනු ලැබේ.*

## 10.7 ඩිජිටල් රජයේ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ අගැයීම (M&E)

***ප්‍රතිපත්ති ප්‍රකාශය - ඩිජිටල් රජය ව්‍යාපෘති ක්‍රියාත්මක කරන සියලුම රාජ්‍ය සංවිධාන එම ව්‍යාපෘති අඛණ්ඩව අධීක්ෂණය සහ අගැයීම කළ යුතුය***

*10.7.1 සියලුම රාජ්‍ය සංවිධාන යෝග්‍ය M&E විධික්‍රමයක් තෝරා ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ICTA හි M&E ඒකකය වෙතින් අවශ්‍ය උපදේශනය ලබාගත යුතුය.*

*10.7.2* ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ අගැයීමේ අරමුණු සඳහා සඳහා *ICTA* මගින් ප්‍රකාශිත අත්පොත පරිශීලනය කළ හැකිය *(*30 වන ඇමුණුම – ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සඳහා අධීක්ෂණ සහ අගැයීම් (*M&E*) මෙහෙයුම් නිර්ණායක)

## 10.8 සීමාව පරයා යාම සහ අවදිමත් භාවය

***ප්‍රතිපත්ති ප්‍රකාශය – සියලුම රාජ්‍ය සංවිධාන පහත සඳහන් අරමුණු සඳහා සන්නිවේදන සැලසුමක් නිර්මාණය කළ යුතුය;***

- ***සියලුම කොටස්කරුවන් වෙත ඩිජිටල් රාජ්‍ය තොරතුරු ව්‍යාප්ත කිරීම***
- ***ඩිජිටල් රාජ්‍ය සේවා භාවිත කරන්නන්ට සහය දැක්වීම***
- ***ඩිජිටල් රාජ්‍ය සේවා භාවිත කරන්නන්ගේ විශ්වාසය ගොඩනැගීම***
- ***භාවිත කරන්නන්ගේ තෘප්ති මට්ටම අගැයීම***

*10.8.1* සියලුම රාජ්‍ය සංවිධාන ඩිජිටල් රාජ්‍ය සන්නිවේදන සැලසුමක් සංවර්ධනය කිරීම, අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් සුරක්ෂිත කිරීම සහ වාර්ෂික පදනමක් මත සැලසුම් ක්‍රියාත්මක කිරීම කළ යුතුය. *<<Link>>* වෙතින් සන්නිවේදන සැලසුමක නියැදියක් ලබා ගත හැකිය.

## ඇ) ප්‍රවීණතා මට්ටම්, කාණ්ඩගත කිරීම සහ RACI සහිතව මෙහෙයුම් නිර්ණායක ක්‍රියාත්මක කිරීම

## ඇ) ඇමුණුම්

*01 වන ඇමුණුම – ඩිජිටල් රාජ්‍ය උදාහරණ ලැයිස්තුව*

*02 වන ඇමුණුම – ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්ති සමාලෝචන කමිටු සාමාජික ලැයිස්තුව*

*03 වන ඇමුණුම – තොරතුරු/දත්ත වර්ගීකරණ ව්‍යුහරාමුව*

*04 වන ඇමුණුම – දත්ත සහ තොරතුරු හවුලේ පරිහරණය පිළිබඳ අවබෝධතා ගිවිසුමෙහි කෙටුම්පත*

*05 වන ඇමුණුම – සේවා මට්ටම් ගිවිසුමෙහි (SLA) අච්චු ආකෘතිය*

*06 වන ඇමුණුම – සේවා වර්ගීකරණ ව්‍යුහරාමුව සහ මෙහෙයුම් නිර්ණායක*

*07 වන ඇමුණුම – බහු නාලිකා සේවා සැපයුම් ව්‍යුහරාමුව*

*08 වන ඇමුණුම – ලංකා ගේට්*

*09 වන ඇමුණුම – ප්‍රමිතිගත ක්‍රියා පටිපාටි අත්පොත/ක්‍රියාවලි අත්පොත*

*10 වන ඇමුණුම – ආයෝජන ප්‍රතිලාභ ආගණනය සඳහා ආයෝජන ප්‍රතිලාභ අච්චු ආකෘතිය*

*11 වන ඇමුණුම – විවෘත දත්ත මූලධර්ම*

*12 වන ඇමුණුම – GPR සඳහා මෙහෙයුම් නිර්ණායක*

*13 වන ඇමුණුම – අවබෝධතා ගිවිසුමෙහි අච්චු ආකෘතිය*

*14 වන ඇමුණුම – ඉ-ඒකාබද්ධතා විගණනය සඳහා මෙහෙයුම් නිර්ණායක*

*15 වන ඇමුණුම – ලංකා රාජ්‍ය ජාලයට සම්බන්ධිත රාජ්‍ය සංවිධාන ලැයිස්තුව*

*16 වන ඇමුණුම – LGC සේවා ලේඛනය*

*17 වන ඇමුණුම – LGPS සේවා ලේඛනය*

*18 වන ඇමුණුම – GovSMS සේවා ලේඛනය*

*19 වන ඇමුණුම – GIC අත්පොත සඳහා අච්චු ආකෘතිය*

*20 වන ඇමුණුම – සමූහ විශේෂිත පුරවැසි ප්‍රඥප්තිය සඳහා අච්චු ආකෘතිය*

*21 වන ඇමුණුම – රාජ්‍ය වෙබ් වසම් ලියාපදිංචිකරණ ප්‍රතිපත්තිය*

*22 වන ඇමුණුම – රාජ්‍ය වෙබ් ප්‍රමිති සහ මෙහෙයුම් නිර්ණායක*

*23 වන ඇමුණුම – රාජ්‍ය ඊමේල් ප්‍රතිපත්තිය*

*24 වන ඇමුණුම – රාජ්‍ය සමාජ මාධ්‍ය මෙහෙයුම් නිර්ණායක*

*25 වන ඇමුණුම – සංකල්ප පත්‍රය සඳහා අච්චු ආකෘතිය*

*26 වන ඇමුණුම – රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිශීලන නියමයන් සඳහා අච්චු ආකෘතිය*

*27 වන ඇමුණුම – මෘදුකාංග පාලන ව්‍යුහරාමුව*

*28 වන ඇමුණුම – PPP පදනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් නිර්ණායක*

*29 වන ඇමුණුම – විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිත කිරීමේ ප්‍රතිලාභ*

*30 වන ඇමුණුම – ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සඳහා M&E මෙහෙයුම් නිර්ණායක*

සටහන – සපයා ඇති සියලුම ඇමුණුම් අඛණ්ඩ පදනමකින් වැඩිදියුණු කරනු ඇත. එවැනි ලේඛන භාවිත කිරීමට පෙරාතුව ඇමුණුමේ නවතම අනුවාදය සඳහා සොයන ලෙස පරිශීලකයන්ට උපදෙස් දෙනු ලැබේ.